# ශ්‍රී ලංකාවේ මහායාන බෝධි සත්ත්ව ප්‍රතිමා පිළිබඳ පුරාවිද්‍යාත්මක අධ්‍යයනය

කේ- එම්- එස්- ආර්- කුලතුංග

පුරාවිද්‍යා අධ්‍යයනාංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය

---

ශ්‍රී ලංකාවේ පිළිගත් දහම ලෙසින් අනුරාධපුර යුගයේ සිට ථෙරවාදී දහම පැවතිය ද ක්‍රි. ව. 3 වන සියවසෙන් පසුව මහායාන බුදුසමය මෙරට නැගී ආ අතර එයට නිදසුනක් ලෙසට ශ්‍රී ලංකාවේ විවිධ ප්‍රදේශවලින් මහායාන බුදුසමයේ ප්‍රධාන අංගයක් වන බෝධිසත්ත්ව වන්දනාව සිදු කළ බවට සාධක පැවතීම දැක්විය හැකි ය. මෙම පර්යේෂණය තුළින් අපේක්ෂිත මූලික අරමුණු ලෙස, මහායානවාදයෙන් පැනනැගුණු මහායාන බෝධි සත්ත්ව ප්‍රතිමා පිළිබඳව පුරාවිද්‍යාත්මක වශයෙන් සොයා බැලීම, බෝධිසත්ත්ව සංකල්පයේ බලපෑම මත ලාංකේය ජන විඥානයෙහි ඇති වූ මහායානවාදී අදහස්වල පිළිබිඹු අර්ථකථනාත්මක විග්‍රහයක යෙදීම, ථෙරවාදී සහ මහායානවාදී බලපෑම් මත ඉදි වූ ප්‍රතිමා පිළිබඳ සන්සන්දනාත්මක පුරාවිද්‍යාත්මක අධ්‍යයනයක් සිදුකිරීම, මහායානවාදය ව්‍යාප්ති ප්‍රදේශය පිළිබඳ පුරාවිද්‍යාත්මක වශයෙන් අධ්‍යයනය දැක්විය හැකිය. පර්යේෂණ අරමුණු සාධනය සඳහා දඹේගොඩ, බුදුරුවගල, කුෂ්ටරාජගල, සිතුල්පව්ව බෝධිසත්ත්ව ප්‍රතිමාව දායක කරගනු ලැබිණි. බෝධිසත්ත්ව ප්‍රතිමා වර්තමානයේ ද නිරූපද්‍රිතව පැවතීම තුළින් පැහැදිලි වන්නේ තවමත් මිනිසුන් තුළ මෙම ප්‍රතිමා පිළිබඳ ගෞරවයක් පවතින බව ය. එහෙයින් මහායානවාදය, බුද්ධ ප්‍රතිමා හා එහි බලපෑම් පිළිබඳ තවදුරටත් විමසුමට ලක් කළ යුතු ය.

ප්‍රමුඛ පද : මහායානවාදය, බෝධිසත්ත්ව වන්දනාව, ථෙරවාදය